පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2015 අගෝස්තු
பொதுக்கலைமாணி பரீட்சை (வெளிவாரி) - 2015 ஆகஸ்ட்
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2015

# සමාජ විද්‍යාව I - (SSG 1)
(සමාජ විද්‍යාවේ න්‍යාය සහ ක්‍රමවේද)

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව අටකි (08).
එක් කොටසකින් ප්‍රශ්න **දෙකක්** (02) තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** (04) පිළිතුරු සපයන්න.

කාලය: පැය තුනයි (03).

---

## පළමු කොටස

1. සමාජ විද්‍යාව ආරම්භ වීම සඳහා බලපාන ලද හේතු සාධක විභාග කරන්න.

2. එමිල් දුර්කයිම්ගෙන් සමාජ විද්‍යාවට සිදු වූ සම්මාදම ගැන රචනයක් ලියන්න.

3. ජෝර්ජ් හර්බර්ට් මීඩ් විසින් ඉදිරිපත් කරන ලද සංකේතාත්මක අන්තර්ක්‍රියාවාදය පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

4. කාර්ල් මාර්ක්ස් විසින් ඉදිරිපත් කරන ලද පරාරෝපණ න්‍යාය පිළිබඳ සාකච්ඡා කරන්න.

## දෙවන කොටස

5. සමාජ පර්යේෂණවල වැදගත්කම සාකච්ඡා කරන්න.

6. ගුණාත්මක පර්යේෂණය යනු කුමක් දැයි විස්තර කරන්න.

7. ලංකාවේ සියදිවි නසා ගැනීම පිළිබඳව පර්යේෂණය කිරීම සඳහා පර්යේෂණ යෝජනාවලියක් සකස් කරන්න.

8. ප්‍රශ්නාවලියක් යොදා ගෙන පර්යේෂණයක් සිදු කිරීමේ දී ලැබෙන වාසි සහ අවාසි පැහැදිලි කරන්න.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2015 අගෝස්තු
பொதுக்கலைமாணி பரீட்சை (வெளிவாரி) - 2015 ஆகஸ்ட்
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2015

## සමාජ විද්‍යාව II - (SSG 2)
## (ව්‍යවහාරික සමාජ විද්‍යාව)

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව අටකි (08).
ඕනෑම ප්‍රශ්න **හතරකට** (04) පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.

කාලය: පැය තුනයි (03).

---

1. I. ව්‍යවහාරික සමාජ විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය හා එහි සංවර්ධනය පිළිබඳව සාකච්ඡා කරන්න.

   II. ව්‍යවහාරික සමාජ විද්‍යාත්මක දැනුම සමාජ ගැටළු විසඳා ගැනීමෙහි ලා යෝජනා ඉදිරිපත් කිරීමට දායක වන ආකාරය පිළිබඳව විස්තර කරන්න.

2. ශ්‍රී ලංකාවේ සමාජ සුභසාධන කටයුතු පිළිබඳව රචනාවක් ලියන්න.

3. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයේ සියදිවි නසා ගැනීම වළක්වා ගැනීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවල වගකීම හා කාර්යභාරය සාකච්ඡා කරන්න.

4. ප්‍රජා සංවර්ධන වැඩ සටහන්වල දී ප්‍රජා දායකත්වය වර්ධනය කිරීමෙහි ලා සළකා බැලිය යුතු සමාජ විද්‍යාත්මක කරුණු මොනවා දැයි සාකච්ඡා කරන්න.

5. "සමාජ විද්‍යාත්මක දැනුම සැළසුම්වලදී යොදා ගැනීමේ ඌණතාවය නිසා ශ්‍රී ලංකාවේ බොහෝ කෘෂිකාර්මික ගොවි ජනපද ව්‍යාපාර අසාර්ථකත්වයට පත් වී ඇත". මෙම කියමන පිළිබඳව ව්‍යවහාරික සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විවේචනය කරන්න.

6. දේශීය රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස "සර්වෝදය" ව්‍යාපාරයේ දැක්ම හා මෙහෙවර පිළිබඳව විස්තර කරන්න.

7. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ගොවි ජනපදවල පවතින වකුගඩු රෝගය ඇති වීම හා ඒ කෙරෙහි හරිත විප්ලවයේ බලපෑම අතර පවතින සම්බන්ධතාවය පිළිබඳව සාකච්ඡා කරන්න.

8. පහත දැක්වෙන මාතෘකාවලින් ඕනෑම **තුනක්** පිළිබඳව සටහන් ලියන්න.

   i. ශ්‍රී ලංකාවේ වියපත් ජනගහනය
   ii. ජනවාර්ගිකත්වය
   iii. නාගරික දුගී බව
   iv. ශ්‍රී ලංකාවේ ගණිකා වෘත්තිය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2015 අගෝස්තු
பொதுக்கலைமாணி பரீட்சை (வெளிவாரி) - 2015 ஆகஸ்ட்
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2015

## සමාජ විද්‍යාව III - (SSG 3)
(දකුණු ආසියාව පිළිබඳ සමාජ විද්‍යාව)

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව අටකි (08).
ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

කාලය: පැය තුනයි (03).

---

1. දකුණු ආසියානු පොදු සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ මොනවා ද?.

2. ජජ්මානු ක්‍රමය යනු කුමක් ද?. ඉන්දියානු කුල ක්‍රමය අධ්‍යයනයේ දී එහි ඇති වැදගත්කම කුමක් ද?.

3. "සිංහල සහ ද්‍රවිඩ ඥාති පදමාලාව ව්‍යුහය අතින් එකිනෙකට සමාන වූවකි" සාකච්ඡා කරන්න.

4. මහාචාර්ය ගණනාථ ඔබේසේකර ඉදිරිපත් කර ඇති විශ්ලේෂණය අනුව චූල සම්ප්‍රදාය සහ මහා සම්ප්‍රදාය යන සංකල්පයන් සාකච්ඡා කරන්න.

5. ශ්‍රී ලංකාවේ ආයුර්වේද ක්‍රමය සහ ආහාර චර්යාව අතර ඇති සම්බන්ධතාවය පිළිබඳව රචනයක් ලියන්න.

6. දකුණු ආසියානු දේශපාලනයේ දී "ආගමික ව්‍යාපාරවල" බලපෑම උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

7. ශ්‍රී ලංකාවේ පවුලේ වර්තමාන ප්‍රවණතාවයන් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

8. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳව සටහන් ලියන්න.

   i. රොබර්ට් රෙඩ්ෆීල්ඩ්
   ii. සංස්කෘතීකරණය
   iii. අවරෝහණය
   iv. ශ්‍රී ලංකා දේශපාලනයේ වර්තමාන ප්‍රවණතා